# ජාතික රාජ්‍ය සභාවේ

# 1978 අංක 29 දරන බූදල් බදු

# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

(1978 ජූලි මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් විශයෙන් පළ කරන ලදි.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 30 යි

තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 29 දරන මුදල් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 14 වන දින]

එල්. ඩී.—ඕ. 18/78.

මුදල් බදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 29 දරන මුදල් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන පනතින් සංශෝධිත මුදල් බදු ආඥාපනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 241 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (vi) වන ඡේදයේ "1963 අගෝස්තු මස පළමුවන දින හෝ ඉන් පසු යම් දිනයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"1963 අගෝස්තු මස පළමුවන දිනය හෝ ඉන් පසු සහ 1977 නොවැම්බර් මස පහළොස්වන දිනයට පසු නොවන දිනයක්"; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(vii) ඔහු මියගිය දිනය 1977 නොවැම්බර් මස දහසය වන දිනය හෝ යම් පසු දිනයක් වන අවස්ථාවක—

(අ) ඔහුගේ මුළු මුදලයෙහි වටිනාකම ඔහුගේ ශ්‍රී ලංකාවේ මුදලයේ වටිනාකම නොඉක්මවන්නේ නම් උපලේඛනයෙහි VII වන කොටසේ II වන තීරයෙන් දක්වා ඇති ප්‍රමාණයන් අනුව, එනම් එම කොටසේ I වන තීරයේ අනුරූප සටහනෙහි දක්වා ඇති මුදලයේ වටිනාකමින් එවැනි පංගුවකට අදාළ කරනු ලැබිය හැකි එක් එක් ප්‍රමාණය අනුව, සහ

(ආ) ඔහුගේ මුළු මුදලයෙහි වටිනාකම ඔහුගේ ශ්‍රී ලංකාවේ මුදලයෙහි වටිනාකම ඉක්මවන්නේ නම්, ඔහුගේ මුළු මුදලය මුළුමනින් ම ඔහුගේ ශ්‍රී ලංකාවේ මුදලය වන අවස්ථාවක, ඔහුගේ මුළු මුදලය පිළිබඳ මුදල් බද්ද වන්නා වූ මුදල ඔහුගේ මුළු මුදලයේ වටිනාකම කෙරෙහි දරන්නා වූ මුදලේ සියයට ප්‍රමාණයට සමාන වන්නා වූ ප්‍රමාණය අනුව

මේ ආඥාපනතේ විධිවිධාන අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 32 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ (1959 අංක 15 දරන පනතින් ඇතුළත් කරනු ලැබූ) 17 අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "1973 නොවැම්බර් මස පළමුවන දින හෝ ඊට පසු යම් තැනැත්තකුගේ මරණය සිදුවී ද" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"1973 නොවැම්බර් මස පළමුවන දින හෝ ඉන් පසු සහ 1977 නොවැම්බර් මස පහළොස් වන දිනට පසු නොවන දිනයක යම් තැනැත්තකුගේ මරණය සිදුවී ද"; සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) 1977 නොවැම්බර් මස දහසය වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකුගේ මරණය සිදු වී ද ඒ තැනැත්තා විසින් 1959 අංක 14 දරන පුද්ගල බදු පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ තෑග්ගක් වශයෙන් බදු අය කළ හැකි යම් දේපළක් තෑගි කරනු ලැබ ඇති අවස්ථාවක ඔහුගේ ශ්‍රී ලංකා බූදලය සම්බන්ධයෙන්, ඔහු මිය ගිය විට ගෙවිය යුතු බූදල් බදු මුදලින් එම තෑගි කරන ලද දේපළෙහි මුළු වටිනාකම ඔහුගේ ශ්‍රී ලංකා බූදලයේ වටිනාකම වූවාක් මෙන් ඒ මුළු වටිනාකමට සමාන වත්කා වූ ඔහුගේ බූදලයේ කොටස වෙනුවෙන් මේ ආඥාපනතේ උපලේඛනයේ VII වන කොටසෙහි සඳහන් ප්‍රමාණයන් අනුව ආගණනය කරනු ලැබූ මුදල හිලව් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 32 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "1973 නොවැම්බර් මස පළමුවන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකුගේ මරණය සිදු වී ද" යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"1973 නොවැම්බර් මස පළමුවන දින හෝ ඉන් පසුව සහ 1977 නොවැම්බර් මස පහළොස් වන දිනයට පසු නොවන දිනයක යම් තැනැත්තකුගේ මරණය සිදු වී ද,"; සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (10) 1977 නොවැම්බර් මස දහසය වන දින හෝ ඉන් පසු යම් තැනැත්තකුගේ මරණය සිදුවී ද ඒ තැනැත්තා විසින් 1959 අංක 14 දරන පුද්ගල බදු පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ හෝ තෑග්ගක් වශයෙන් බදු අය කළ හැකි යම් දේපළක් තෑගි කරනු ලැබූ අවස්ථාවක, මේ ආඥාපනතේ කාර්යයන් සඳහා එම දේපළෙහි වටිනාකම, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී පුද්ගල බදු පනත යටතේ දායක මුදල නිර්ණය කිරීමේ කාර්ය සඳහා හෝ ඉහත කී දේශීය ආදායම් පනත යටතේ බද්ද නිර්ණය කිරීමේ කාර්ය සඳහා එම දේපළෙහි වටිනාකම විය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ " පොල්මැකරු " පිළිබඳ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

' " තෑග්ග " යන්නෙන් 1959 අංක 14 දරන පුද්ගල බදු පනත යටතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ තෑග්ගක් වශයෙන් බදු අය කළ හැකි යම් තෑග්ගක් අදහස් වන්නේ ය. එහෙත් 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 40 (උ) වන වගන්තියේ විධිවිධාන යටතේ තෑග්ගක් වන්නේ යයි සලකනු ලබන තෑග්ගක් ඊට ඇතුළත් නොවිය යුතු ය ; '.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ අගට පහත දැක්වෙන අලුත් කොටස එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

" VII වන කොටස

| I | | II<br>සියයට ප්‍රමාණය |
|---|---|---|
| මුදලයේ වටිනාකමින් පළමුවන රු. 50,000 ට | ... | නැත |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 30,000 ට | ... | 5 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 30,000 ට | ... | 7½ |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 30,000 ට | ... | 10 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 40,000 ට | ... | 13 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 50,000 ට | ... | 14 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,00,000 ට | ... | 16 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,00,000 ට | ... | 18 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,00,000 ට | ... | 24 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,00,000 ට | ... | 30 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,25,000 ට | ... | 32 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 1,25,000 ට | ... | 36 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 2,00,000 ට | ... | 42 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 3,50,000 ට | ... | 48 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 5,00,000 ට | ... | 55 |
| මුදලයේ වටිනාකමින් ඊළඟ රු. 6,00,000 ට | ... | 60 |
| ශේෂය මත | | 70". |